# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2467/68 - 2025 දෙසැම්බර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2025.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DSO/HOM/LAC/141.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර* :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෝමාගම ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 520001-31-28 සහ 2025.11.13 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 1, 3, 5, 6, 8, 10, 13, 14 සහ 17 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.058 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි.

1. කැබලි අංකය 01

ඉඩමේ නම: ගොඩකගහවත්ත *හෙවත්* වෙරළුපිටියාවත්ත වරිපනම් අංකය 102/7 (කොටසක්) කොළඹ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 47, දුම්රියපොළ පාර, හෝමාගම පදිංචි හේවාවසම් ගමගේ *නොහොත්* ජයතුංග අච්චිගේ ඩිමානි තාරකා; ප්‍රමාණය: හෙක්. 0.0139.

2. කැබලි අංකය 03

ඉඩමේ නම: ගොරකගහකුඹුර වරිපනම් අංකය 107 (කොටසක්) කොළඹ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 327A, දේවාල පාර, කටුවාන, හෝමාගම පදිංචි සර්පවෙදගේ ඉන්දික; ප්‍රමාණය: හෙක්. 0.0090.

3. කැබලි අංකය 05

ඉඩමේ නම: ගොරකගහකුඹුර සහ කටුකැදැල්ලේකුඹුර වරිපනම් අංකය 105, කොළඹ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 456/2C, නීලම්මහර පාර, ගොඩිගමුව, මහරගම පදිංචි ඕවිටිගල හේවගේ දෝන ප්‍රියන්ති; ප්‍රමාණය: හෙක්. 0.0072.

4. කැබලි අංකය 06

ඉඩමේ නම: -; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: -; ප්‍රමාණය: හෙක්. 0.0032.

5. කැබලි අංකය 08

ඉඩමේ නම: අලුබෝගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 103, වලව්ව හංදිය, හයිලෙවල් පාර, හෝමාගම පදිංචි කවිරංගගේ සුනිල් ජයරත්න පීරිස්; ප්‍රමාණය: හෙක්. 0.0026.

**6. කැබලි අංකය 10**

ඉඩමේ නම: අලුබෝගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 391/3, වලව්ව හන්දිය, හයිලෙවල් පාර, හෝමාගම පදිංචි ගමගේ දොන් කරුණාදාස; ප්‍රමාණය: හෙක්. 0.0001.

**7. කැබලි අංකය 13**

ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0203.

**8. කැබලි අංකය 14**

ඉඩමේ නම: -; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: -; ප්‍රමාණය: හෙක්. 0.0006.

**9. කැබලි අංකය 17**

ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0011.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.01.21 වැනි දින පෙ.ව. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.01.12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**බී. ඒ. ඩී. චින්තක,**
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2025 දෙසැම්බර් මස 15 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0178

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WEG/LAN/L8/ACQ/54-II.

ඉහත කරුණ සම්බන්ධව අංක 2452/22 හා 2025 සැප්තැම්බර් මස 03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීම වෙත අවධානය යොමු කෙරේ. එම දැන්වීමේ පරීක්ෂණ දිනය 2025 ඔක්තෝබර් 27 යනුවෙන් ද, ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමේ දිනය 2025 ඔක්තෝබර් 21 යනුවෙන් ද සඳහන් වේ.

එම දැන්වීමේ පරීක්ෂණ දිනය 2026.01.26 වශයෙන් ද, ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමේ දිනය 2026.01.19 වශයෙන් ද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ටී. එල්. එන්. එස්. මෙන්ඩිස්,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2025 දෙසැම්බර් මස 15 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0179

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.